# විඤ්ඤාණය හා සංසාර ප්‍රවෘත්තිය පිළිබඳ ආදි බෞද්ධ හා ථේරවාදි ආකල්පය

- උපශාලාධිපති කරපික්කඩ සෝහිත හිමි

ආදි බුදුසමයට අනුව ජීවිතයක ආරම්භය යනු උපත නොවේ. පුද්ගලයා අනාදිමත් කාලයක පටන් සසර තුළ නොයෙකුත් අනන්ත දුක් විඳිමින් පැමිණි බවත්, එසේම දුක කෙළවර කරන තුරු සසර පුරාවට ගමන් කරන බවත්, බෞද්ධ ඉගැන්වීමයි.[1] "ඉපදෙමින්, දිරමින්, මිය යමින්, චුත වෙමින් නැවත ඉපදෙමින් ජරා මරණ දුකෙහි නිස්සරණයක් නොදකින්නා වූ සත්‍වයා කවරදාක මෙම ජරා මරණ දුකට නිස්සරණයක් පනවන්නේ ද ?" යන්න පුද්ගලයා හමුවේ ඇති ප්‍රධාන ගැටළුව ලෙස බුදුදහම දකියි.[2] එසේම චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීමට නොහැකිව දීර්ඝ කාලයක් සසර තුළ ඔබලා මෙන්ම මම ද සැරිසැරූ බව බුදුන් වහන්සේ දේශනා කොට ඇත.[3] මෙම සියලු දේශනා තුළින් පැහැදිලි වන කාරණාව නම් පුද්ගලයා යනු සංසාරගත සත්‍වයෙකු බවයි. මේ තුළ බුදුදහම ආත්මවාදි චින්තනයක් ලෙස ඇතැම් අය චෝදනා කොට ඇත. මෙම මතය රැගත් සාති නම් භික්ෂුවක් පිළිබඳ ම.නි. මහාතණ්හාසංඛය සූත්‍රයෙහි කරුණු දැක්වේ.[4] කෙසේ වෙතත් උක්ත කාරණාව විෂයෙහි බුදුසමය ආත්මවාදී ස්වරූපයක් උසුලන බව ආදි බුදුසමයෙන් තරයේ ප්‍රතික්ෂේප වී ඇත.[5] නමුත් පෙර භවයත්, මතු භවයත් අතර සබඳතාවක් පැවැත්ම පිළිබඳ ආකල්පය බුදුසමය බැහැර කොට නොමැත. ප්‍රතීත්‍ය සමුප්පාද න්‍යාය තුළ "විඤ්ඤාණ පච්චයා නාම රූපං" යනුවෙන් විග්‍රහ වන්නේ එම කාරණාවයි. මෙය පැහැදිලිව තේරුම් ගැනීම සඳහා



සත්‍වයෙකුගේ පහලවීම හෙවත් උපත කෙසේ සිදු වේදැයි අධ්‍යයනය කිරීම සුදුසුය.

ජීව විද්‍යාත්මක හා වෛද්‍ය විද්‍යාත්මක තොරතුරුවලට අනුව, පළමුව මව ඔසප්වීම හෙවත් මාස ශුද්ධියෙන් අනතුරුව සුදුසු තත්වයකට පත්ව සිටිය යුතුය. එසේ සිටියදී මසකට වරක් නිකුත්වන ස්ත්‍රී බීජයත් (Ovam) පියාගෙන් ලැබෙන පුරුෂ බීජ මිලියනයක් තරම් ප්‍රමාණයෙන් එකක් (Sperm) සමඟ එක්වීමෙන් ප්‍රතිසන්ධියක් (Conception) සිදු වෙයි. මෙම අවස්ථාව ජීවයක ආරම්භය ලෙස සළකනු ලබයි. සත්ත්වයෙකුගේ ආයුකාලය ගණනය කරනුයේ මෙතැන් පටන්ය.[6] ඉන් අනතුරුව ජීව විද්‍යාත්මක සාධකවලට අනුව දරුවෙකු සාමාන්‍යයෙන් මව්කුසක සති 38 ක් හෝ 40 ක් පමණ කාලයක් රැඳී සිටින බව දක්වා ඇත. (නමුත් බුදුසමය මේ පිළිබඳව දක්වා ඇත්තේ සති 42 ක කාලයක් බවයි.[7] ම.නි. මහාතණ්හා සංඛය සූත්‍රයේ ද පවසා ඇත්තේ නව වැනි හෝ දහ වැනි මාසය ඉක්මීමෙන් ප්‍රසූතිය සිදුවන බවයි.)[8] මේ පිළිබඳ අදහස් දක්වන මාර්ටින් වික්‍රමසිංහ මහතා භව කර්ම විකාශය නැමැති කෘතියෙහි මෙසේ දක්වයි. "අඹුසැමි සංසර්ගයේ දී ස්ත්‍රියගේ අර්තවාණුවක් හා පිරිමියාගේ ශුක්‍රාණුවක් ද සංයෝග වෙයි. සංයෝග වීමෙන් සැදෙන බිජුවට දෙකට, හතරට, අටට, සොළොසට, දෙතිසට යනුවෙන් බෙදී බෙදී වැඩීමෙන් බිළිදාගේ හිස, අත්, පා සහිත කය සැදෙයි. කය සැදෙන මේ කෙළ ගණන් ජීව කණිකාවල වර්ණාංශු 46 බැගින් ඇත. එයින් 23 ක් පියාගේ ශුක්‍රානුවෙන් ද අනෙක් 23 මවගේ රේතසානුවෙන් ද ලබා යුගල විසින් කායික ජීවාණුවල වෙති. එහෙත් ගැබ් පිහිටන අවස්ථාවෙහිම වර්ණාංශු 23 බැගින් ඇති මවගේ ජනන ජීව කණිකා ද වර්ණාංශු 23 බැගින් ඇති පියාගේ ජනන ජීවකර්ණිකා ද වෙති."[9] මේ පිළිබඳ බෞද්ධ මතය විමසීමේ දී ම. නි. මහාතණ්හාසංඛය සූත්‍රය තුළ කලලයක් නිර්මාණය වීම සඳහා මූලික වන්නා වූ ප්‍රධාන කරුණු 03 ක් පිළිබඳ දැක්වේ.

1. මව්පිය දෙදෙනාගේ සංගමය සිදුවීම. (මාතා පිතරෝ සන්නිපතිතා හොන්ති)

2. මව ඔසප්ව සිටීම. (මාතාච උතුනී හොති)
3. ගන්ධබ්බයකුගේ එළඹ සිටීම.
   (ගන්ධබ්බොච පච්චුපට්ඨිතො හොති)[10]

මේ අනුව දෙමාපියන්ගේ සංවාසය, මව ඔසප්වීමෙන් පසු සුදුසු තත්වයක පසුවීම හා ගන්ධබ්බයෙකුගේ පැමිණීම එනම් උපතක් බලාපොරොත්තු වන සත්වයෙකුගේ ප්‍රතිසන්ධි චිත්තය එළඹ සිටීම යන කරුණු තුන සම්පූර්ණ විය යුතුය. මේවායින් එකක් හෝ අඩුවී නම් පිළිසිඳ ගැනීමක් හෙවත් කලලයක නිර්මාණයක් සිදු නොවන බව දැක්වෙයි. නමුත් මහාතණ්හාසංඛය සූත්‍රය තුළ මෙසේ දක්වා ඇත්තේ එක් සත්ව කොට්ඨාසයක නිර්මාණයක් පිළිබඳ පමණි. මීට අමතරව වූ සත්ව ජාති 03 ක් පිළිබඳ ආදි බුදුසමයේ කරුණු දැක්වේ. ඒ අනුව සත්වයෝ ආකාර හෙවත් ජාති සතරක් ඔස්සේ ප්‍රතිසන්ධිය ලබති. මෙම ජාති සතර නම්,

01. අණ්ඩජ
02. ජලාබුජ
03. සංසේදජ
04. ඕපපාතික

මෙහි දී පක්ෂි, සර්ප, මත්ස්‍ය ආදි බිජුවලින් උපදින සත්වයෝ "අණ්ඩජ" සත්වයෝය. මව්කුස ''වැදෑමස'' යැයි කියන සම් කොපුවෙහි උපදිනා මනුෂ්‍ය, ගව, මහිස ආදි සත්ත්වයෝ "ජලාබුජ" සත්වයෝය. කුණුමස්, කුණුමාලු ආදි ඇතැම් ද්‍රව්‍යයන්හි උපදිනා සත්ත්වයෝ "සංසේදජ" සත්වයෝය. කැටපත් ආදියෙහි පහළවන ඡායාවන් මෙන් සර්වාංග ප්‍රත්‍යංග පරිපූර්ණත්වයෙන් පහළවීම් වශයෙන් උපදින සත්වයෝ "ඕපපාතිකයෝය". නරකයෙහිද, නිජ්ඣාමතණ්හික නම් වූ ප්‍රේතයෝනියෙහි ද, දිව්‍ය බ්‍රහ්මලෝකවල ද උපදින්නන් ඕපපාතික සත්වයන් ලෙස දැක්වේ. ඒ ඒ සත්වයන්ගේ රූපයන්ගේ පහලවීම වනුයේ ඒ ඒ සත්ත්ව යෝනිවල නොයෙක් ආකාරයෙනි. සත්වයා කෙසේ කවරාකාරයකින් කවර තැනක



උපත ලැබුව ද ආදි බුදුසමයට අනුව ඔහුගේ පෙර භවයත් මතුභවයත් අතර යම් සබඳතාවක් තිබිය යුතුය. එසේ නොවූ විට පුණ්‍ය, පාප විපාක විඳීම, බෝසත් පෙරුම්දම් පිරීම ආදී නොයෙකුත් කරුණු සඳහා අර්ථ දැක්විය නොහැක. පහලවන්නා වූ සත්ත්වයන් අතර, අණ්ඩජ හා ජලාබුජ සත්ත්ව කොට්ඨාසය පිළිබඳ පමණක් මහාතණ්හාසංඛය සූත්‍රයේ ඉහත දැක්වූ කාරණා අදාළ වේ. සත්ත්වයාගේ නිර්මාණය සඳහා වූ කලලය රූපයන් සමූහයකගේ එකතුවෙන් සිද්ධ වේ. සමූහයකට සම්බන්ධ නොවී තනිව රූපයකට ඉපදිය නොහැක. එක්ව උපදින රූප සමූහයන්ට "රූප කලාප" යැයි කියනු ලබයි. පඨවි රූපය, ආපො රූපය, තෙජො රූපය, වායො රූපය, වර්ණ රූපය, ගන්ධ රූපය, රස රූපය, ඕජාරූපය යන මේ අටඑකිනෙක ගැටී සම්බන්ධ වී එක් පිණ්ඩයක්ව උපදියි. ඒ පිණ්ඩයට ශුද්ධාෂ්ටකකලාප යැයි කියනු ලබයි. එම අටට ජීවිත රූප, චක්ෂු ප්‍රසාද රූප, ශ්‍රෝත ප්‍රසාද රූප, ඝාණ ප්‍රසාද රූප, ජිව්හා ප්‍රසාද රූප, කාය ප්‍රසාද රූප ආදීන්ගේ ඇතැම් රූප එක්වීමෙන් රූප නවය, දහය, එකොළහ, දොළහ, දහතුන, බැගින් ඇත්තා වූ කලාප නිර්මාණය වේ. දහතුනට වඩා ඇති රූප කලාප නිර්මාණය නොවේ. මීට අමතරව රූප නිර්මාණය හෙවත් උප්පත්තියක් සඳහා කම්ම, චිත්ත, උතු, ආහාර යනුවෙන් කරුණු 04 ක් ද පාදක වේ. මෙහි දී සත්ත්වයාගෙන් බාහිර වූ කරුණක් ලෙස දක්නට ඇත්තේ "උතු" යන්න පමණයි. එනම් ශීත, උෂ්ණ යන සාධක දෙක පමණි. අනෙක් සියලු සාධක සත්ත්වයාගේ අභ්‍යන්තරයෙහි වේ. මෙම අවස්ථාව තුළ සත්ත්වයාගේ අතීත කර්ම පදනම් කොට පවතින ප්‍රතිසන්ධි චිත්තයත් සමගම ඉහත දැක් වූ අණ්ඩජ, ජලාබුජ, යෝනි දෙකට අයත් සත්ත්වයන්ට කාය දශකය, භාව දශකය, වත්ථු දශකය යනුවෙන් රූප කලාප තුනක් පහල වේ. මෙයින් ද සමහර සත්ත්වයන් කෙරෙහි භාව දශකය පහල නොවේ. එනම් ස්ත්‍රීභාවය හෝ පුරුෂ භාවයයි. මෙම භාව දශක පහල නොවූ සත්ත්වයන් නපුංසකයන් ලෙස සළකනු ලබයි. එසේම කාය දශකය තුළ පඨවි, ආපො, තෙජො, වායො, වණ්ණ, ගන්ධ, රස, බීජ, ජීවිත, කාය යන කොටස් දහයක් ඇතුලත් වේ. මෙසේ රූප කලාප දෙකකින් හෝ තුනකින් යුක්තව එසේම ප්‍රතිසන්ධි

විඤ්ඤාණය සහිත වූ රූප පිණ්ඩය "කලල රූපයක්" යැයි සළකනු ලබයි.

මෙම ක්‍රියාදාමය වෛද්‍ය විද්‍යාවට අනුව බැලීමේදී සිදුවන්නේ පළමුව පියාගේ ශුක්‍රාණුවක් (Sperm) හා මවගේ ඩිම්බාණුවක් (Ovam) සංවාසයෙන් පැය 10 ක පමණ කාලයක් තුළ එකට එක්වීමයි. එතැන් පටන් එය එක් බීජයක් බවට පත්ව, නැවත දෙකට බෙදීම ආරම්භ වෙයි. මෙම කාර්යය ආරම්භ වන්නේ පැලෝපීය නාලය තුළදීමය. එම සෛල ගොණුව පෙන පිඩක් බඳුය. සෛල සමූහය (ball of cells) ගර්භාෂයට ළඟාවීමට දින කීපයක් ගතවන බව විද්‍යාත්මක මතයයි. ගර්භාෂයේ බිත්තියට සම්බන්ධ වන විට එය සෛල 32 ක් පමණ ඇති ගොණුවක් බවට පත් වේ. මෙහි සෛල ඉතා වේගයෙන් බෙදී යාමට පත්වේ. එය සතියක් පමණ වන විට සෛල 250 ක් දක්වා බෙදී යයි. එයින් නිර්මාණය වන්නා වූ කලලය ජීවවිද්‍යාත්මක නිරීක්ෂණයන්ට අනුව පළමු සති හතර සිට අට දක්වා කාලය තුල මි.මි. 4 සිට 40 දක්වා වර්ධනය වේ. හයවන සතියේ අත්පා ගැටිති මතුවීමට පටන් ගැනේ. හත්වන සතියේ දී ඇඟිලි නිර්මාණය වීම දක්නට ඇත. එසේම මෙම සතිය තුළ මතුපිටින් ඇස් සකස් වීම යන්තමින් ආරම්භ වේ. හත්වන සතියේ සිට දොළොස්වන සතිය වන විට මි.මී. 90 ක් තරම් වැඩෙන කලලය ග්‍රෑම් 45 ක් තරම් බර වේ. එසේම අටවන සතියේ පටන් දරුවාගේ අස්ථි සකස්වීම ද ආරම්භ වෙයි.

මෙම ක්‍රියාදාමය පිළිබඳ බෞද්ධ ආකල්පය විමසීමේ දී බුදුරජාණන් වහන්සේ යක්ඛ සංයුක්තයේ දී කලල රූපයේ ආරම්භය පටන් මනුෂ්‍යයාගේ ක්‍රමික වර්ධනය පිළිවෙළින් පෙන්වා දී ඇත.

පළමුව මවගේ ගැබිහි කලල රූපය හටගත්තේය. එම කලල රූපයෙන් අබ්බුදය හෙවත් පෙණපිඩ හටගත්තේය. අබ්බුදයෙන් පේශිය හටගත්තේය. පේශියෙන් ඝනය හටගත්තේය. ඝනයෙන් අතු පසක් ද කෙස්, ලොම්, නිය ද හටගත්තේය.[11] මෙහි දී "කලලය" යනු කෙසේදැයි විග්‍රහකොට ඇත්තේ "තලතෙල් බිඳුවක් යම් බඳු ද, පිරිසිදු ගිතෙල් බිඳුවක් යම් බඳු ද, එබඳු පැහැය හා සටහන ඇති දෙය කලලය යැයි කියනු ලැබේ."[12] යනුවෙනි. මෙයින් කලලයේ පැහැය හා ආකාරය දක්වා ඇති අතර, එහි ප්‍රමාණය ලෙස සංයුක්ත නිකාය අටුවාව දක්වනුයේ "හිමාලයෙහි වෙසෙන ඉතා සිහින් ලොම් ඇති "ජාති උණ්ණා" නම් වූ එළුවන්ගේ ලොම් තුනකින් කළහුයෙහි අගට එන තෙල් බින්දුව ප්‍රමාණය"[13] යනුවෙනි. එසේම මේ පිළිබඳ විභංග අටුවාවේ සඳහන් වනුයේ "ජාති උණ්ණා" නම් වූ සිහින් එළු ලෝමයක් පිරිසිදු කළ තෙලෙහි ලාගත් කල්හි එහි අග සිටින තෙල් බින්දුව ප්‍රමාණය[14] ලෙසය. මේ ආකාර වූ කලලය සතියක් පවතී. එය මෝරා සමූහාකාර වී කලලාකාරය අතහැර අබ්බුද නම් ස්වරූපයට පත් වේ.[15] මෙම අබ්බුද ස්වරූපය සතියක් පමණ පවතියි. එය මෝරා සමූහාකාර වූයේ මීලඟට පේශී නම් අවස්ථාව නිර්මාණය වේ.[16] පේශිය ද සතියක් පවතියි. එය මෝරා සමූහාකාර වන්නේ, ඉන් අනතුරුව "ඝන" නම් අවස්ථාවට පත් වන්නේය.[17] මේ අවස්ථාව විග්‍රහ කරනුයේ "යම් සේ කිකිළියකගේ බිත්තරය හාත්පසින් වටවේද, කර්ම හේතුවෙන් උපන්නා වූ ඝනයාගේ සටහන ද ඒ ආකාරයෙන්ම වන්නේය"[18] යනුවෙනි. මෙසේ සතරවන සතිය තුළබිත්තරයක් වැනි වූ ඝනය මේරීමට පැමිණි කල පස්වන සතියේ ඒ ඝනයෙහි හිස හටගන්නා තැන එක් බුබුලක්ද, අත් හටගන්නා දෙතැන බුබුළු දෙකක්ද, පා හටගන්නා දෙතැන බුබුළු දෙකක්ද යනුවෙන් බුබුළු පහක් පහල වෙයි. ඒ බුබුළු ක්‍රමයෙන් වැඩී ඇස් කන් ආදිය හා කෙස් ලොම් නිය ද පහළ වේ.

මෙම ක්‍රියාවලිය තුළ විඤ්ඤාණයාගේ බලපෑම සිදුවන්නේ කවර අවස්ථාවකදැයි විමසූ කළ, කලලය ජීවයක් වන අවස්ථාව විඤ්ඤාණයේ බලපෑම සිදුවන අවස්ථාව ලෙස සැලකිය හැකිය. මහාතණ්හා සංඛය සූත්‍රයේ දැක්වෙන "ගන්ධබ්බොච පච්චුපට්ඨිතො හොති" යන අවස්ථාව මෙම අවස්ථාව ලෙස දැක්වේ. ඒ තුළින් අතීත කර්ම ශක්තීන් මතු භවය හා සම්බන්ධ වීම සිද්ධ වේ. මෙය පැහැදිලිව තේරුම් ගැනීමට ගන්ධබ්බ අවස්ථාව යනු කුමක්ද, ඒ තුළින් අතීත භවය හා මතු භවය කවර ආකාරයකින් සම්බන්ධ වේදැයි අවබෝධ කොටගත යුතුය. සත්ත්වයාගේ සංසාර ප්‍රවෘත්තිය පිළිබඳ අධ්‍යයනයේ දී අතීත

භවය හා වර්තමාන භවය අතර සිදුවන්නා වූ ඍජු සම්බන්ධතාවක් ආදි බුදුසමයේ කිසිදු දේශනාවක් සොයාගත නොහැක. නමුත් සමුද්‍ර මධ්‍යයේ නිර්මාණය වන්නා වූ තරංගයක් වෙරළට ගැසූ විට එය නිර්මාණය වූ පළමු තරංගය නොවන්නාක් මෙන්ම එයට අනෙකක් ද නොවේ. ඒ ආකාරයෙන්ම සංසාරගත පුද්ගලයා වර්තමානයේ වන්නේ අතීතයේ වූ අය නොවන්නා සේම අතීතයට සම්බන්ධ වූවකි. මෙය තහවුරු කෙරෙන්නා වූ දළ අදහසක් දී.නි. මහාසතිපට්ඨාන සූත්‍රයේ එන මරණය හා නැවත උපත පිළිබඳ දක්වන දේශනාව තුළ වේ. මෙහි මරණය ලෙස දැක්වෙන්නේ ඒ ඒ සත්ත්වයෝ ඒ ඒ සත්ත්ව නිකාය තුළින් ඉවත් වීමයි.[19] "චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො" මෙම සියලු පද තුළින් අර්ථවත් වනුයේ ඉවත්මක් පිළිබඳවය. නමුත් මෙහි කිසිදු අවස්ථාවක විනාශයක් හෝ අවසානයක් පිළිබඳව දක්වා නොමැත. එසේම මෙම මරණයත් සමඟ එහි ඊළඟ පියවර ලෙස මෙම සූත්‍ර දේශනාව තුළ විස්තර වන්නේ උපත පිළිබඳවය. උපත යනු ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ත්ව නිකායවල ඉපදීමයි.[20] මේ පිළිබඳව දක්වන "ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති, ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො" යන පද තුළින් අමුතුවෙන්ම සත්ත්වයෙකුගේ ආරම්භයක් පිළිබඳ අදහසක් දැකගත නොහැක. ඒ තුළින් සංසාරගත ධර්මයක නැවත පහළ වීමක් සිදුවූයේයැයි යන අදහස වේ යැයි සිතේ. කෙසේ වෙතත් එම අතීත භවය හා මතු භවය අතර නිර්මාණය වන්නා වූ මානසික සබඳතාව පිළිබඳ ක්‍රියාදාමය මෙසේ දැක්විය හැක. මරණාසන්න සත්ත්වයාගේ චිත්තසන්තානයට කර්මය, කර්ම නිමිත්තය, ගතිනිමිත්තය යන තුනෙන් එකක් එළඹ සිටියි. මෙහි "කර්මය" යනු මැරෙන්නා වූ සත්ත්වයා විසින් ඒ භවයෙහි කළාවූ ද එයට පෙර භවවලදී කළාවූද කුශලාකුශල කර්මයෝය. මරණාසන්න සත්ත්වයා හට තමා කරන ලද කුශලාකුශල කර්මයන් අතුරෙන් යම් කිසිවක් ඒ අවස්ථාවේ දී සිහි වේ. එය කර්මය එළඹ සිටීමයි. "කර්ම නිමිත්ත" යනු යම් කර්මයක් කිරීමට උපකරණ වූ වස්තූන් හා පුද්ගලයෝය. "ගතිනිමිත්ත" යනු කර්මය හේතුකොට මතු උපදින ස්ථානයේ ඇති දෙයක් පිළිබඳ දැකීමයි.



නිදසුනක් ලෙස සමහර පුද්ගලයන් වෙත මරණාසන්නයේ දී ගිනිජාලා ආදී වූ භයංකර වස්තූන් පෙනෙන්නේය. එසේම මරණයෙන් අනතුරුව මව්කුසක ඉපදීමක් වේ නම් ඔහුට රතු රෙද්දක් වැනි වූ මවුකුසම දර්ශනය වන්නේය. මේ සියල්ල දර්ශනය වන්නේ චිත්ත සන්තානය තුළය.

මෙසේ මෙම තුන් ආකාර වූ අවස්ථාවන් අතරෙන් එළඹ සිටි දෙයක් අරමුණු කොට මැරෙන සත්ත්වයාගේ චිත්ත සන්තතිය ඒ අනුවම පවතියි. එසේම එම චිත්තසන්තතියට අනුවම කර්මයට අනුරූප පරිදි පැමිණිය යුතු අභිනව භවය දෙසට යොමු වේ. හෙවත් එම භවය වෙත නැමේ. මෙසේ මරණයට පත්වන පුද්ගලයාගේ චිත්ත සන්තතිය අභිනව භවයට නැමී, බර වී පවත්නා කල්හි, වර්තමාන ශරීරය ඇසුරු කොට උපදනා අවසාන සිත ඉපද නිරුද්ධ වූ පසු ඒ සිත් වැලෙහි එයට අනතුරුව ඉපිදිය යුතු සිත, එළඹ සිටියා වූ කර්මාදි ආරම්මණයම අරමුණු කොට කර්මානුරූප පරිදි ඉපදිය යුතු ස්ථානයේ ඒ කර්මයම විපාකත්‍වයට පැමිණීම් වශයෙන් උපදින්නේය. ඒ සිත උපන් පසු සත්ත්වයා අභිනව භවයට පැමිණියේ යැයි කියනු ලැබේ. සත්ත්වයාගේ සිත් වැලෙහි අතීත භවයට අයත් ශරීරයේ අවසාන වශයෙන් පහළ වූ සිතට "චුති චිත්තය" යැයි ද අභිනව භවයේ ආදියෙහිම පහළවූ සිතට "ප්‍රතිසන්ධි චිත්ත" යැයි ද කියනු ලැබේ. ප්‍රතිසන්ධි චිත්තය පහළවීම සමගම හෝ පහළ වීමෙන් පසු ක්‍රමයෙන් කර්මයට හා ඒ ඒ සත්ත්ව ජාතියට අනුරූප වන පරිදි ශරීරයක් ද ඇති වේ. ඒ ශරීරය අතීත ජාතියේ ශරීරය හා සම්බන්ධයක් නොමැත. සිත පමණක් අතීත ජාතියේ සිත් පරම්පරාවට සම්බන්ධ වේ.

මෙම ක්‍රියාදාමය භෞතික ශරීරය හා සම්බන්ධව ද ඍජු ලෙස බැඳී පවතියි. ඒ පිළිබඳ අදහස් දක්වන රේරුකානේ චන්දවිමල හිමියෝ මෙසේ දක්වති. "සත්ත්ව ශරීරයේ හෘදය කෝෂය ඇතුලත පවත්නා ලෙය ඇසුරු කොට පවත්නා වූ විඥාන ධාතුවට ආධාරස්ථාන වන එක්තරා ධාතු කොටසක් ඇත්තේය." එයට අභිධර්ම ප්‍රකරණවල "වස්තු රූපය" යන නම හා "හෘදය වස්තුව" යන නම ද ව්‍යවහාර කොට තිබේ. ඒ

වස්තුරූපය විඥාන ධාතුවසේම බිඳි බිඳි නැවත නැවත උපදිමින් පරම්පරා වශයෙන් පවත්නකි. හෘදය කෝෂය තුළ නිතර පවත්නා ලෙයක් නොමැත. නිතරම එක් තැනකින් ලෙය එයට ඇතුල්ව තවත් තැනකින් බැහැරව යන්නේය. එහෙත් හෘදය රූපය යැයි කියන ලද ධාතු විශේෂය හෘදය කෝෂයෙහි වූ ලෙය සමඟම පවතිනවා මිස ඉන් බැහැරවන ලෙය හා එක් වී පිටවී නොයයි. එබැවින් වස්තු රූපය හෘදය කෝෂය තුළම පවත්නේ යැයි කියනු ලැබේ. සත්ත්වයාගේ සිත් පරම්පරාව පවත්නේ ඒ වස්තු රූපයෙහිය. හෘදය කෝෂය වනාහි පරණ ලෙය බැහැර කරනු පිණිස හා අලුත් ලෙය ගැනීම පිණිස ද නිතර ක්‍රියා කරන්නේය. යම් කිසි හේතුවකින් හෘදය වස්තුව ක්‍රියා විරහිත වුවහොත් එහි ලෙය විකෘතියට පැමිණේ. ඉන් පසු ඒ ලෙයෙහි විඥාන ධාතුවට නිඃශ්‍රය වන හෘදය රූප නම් වූ ධාතු කොටසට පැවතිය නොහැකි වේ. එය අනුක්‍රමයෙන් හීන වී ගොස් අන්තිමට කිසිවක් ඉතිරි නොවී අභාවප්‍රාප්ත වේ. ඉන්පසු ශරීරයේ සිත් ඉපදීමට සුදුසු තැනක් නැති වේ. ඒ ශරීරයෙහි උපදිනා අන්තිම සිත නිරුද්ධ වූ කල්හි සත්ත්වයා මළේයැයි කියනු ලැබේ. හෘදය ක්‍රියා කිරීම නැවතී කොපමණ වේලාවකින් අන්තිම සිතේ නිරෝධය වූ මේ මරණය සිදුවේද යන්න නිශ්චිත වශයෙන් කිව නොහැකිය. එහෙත් එයට වැඩි කලක් ගත නොවන බව කිව හැකිය. හෘදය රූපය ඇසට නොපෙනෙන සියුම් ධාතු විශේෂයකි. එහි ඇති නැති බව නිසා ලෙයෙහි අමුත්තක් ද නොපෙනේ. විඥානයට නිඃශ්‍රය වන දෙයක් මේ ශරීරයෙහි නැතිවුවද, විඥාන පරම්පරාවෙහි එක් විඥානයක් නිරුද්ධ වීම සමඟම අතරක් නොදක්වා තවත් විඥානයක් ඉපදීමේ ශක්තිය නොනැසුණු බැවින්, එක් ශරීරයක් ඇසුරුකොට උපදනා අන්තිම විඥානය නිරුද්ධ වනු සමගම ඒ පරම්පරාවෙහි ඒ විඥානයට අනතුරුව ඉපදිය යුතු විඥානය කොහි හෝ යම්කිසි අන් තැනක උපදනේය. එක් ශරීරයක අන්තිමට නිරුද්ධ වන විඥානයට "චුති චිත්ත" යැයිද එයට අනතුරුව අන්තැනක උපදනා ඒ පරම්පරාවට අයත් චිත්තයට "ප්‍රසන්ධි චිත්ත" යැයි ද කියනු ලැබේ.[21]



මෙම සියලු කාරණාවලින් පෙනී යන්නේ චුති චිත්තයෙන් අනතුරුව ප්‍රතිසන්ධි චිත්තය නිර්මාණය වී අතීත භවයත්, එයට මානසික වශයෙන් සම්බන්ධ වූ වර්තමාන භවයත් නිර්මාණය වන ආකාරය පිළිබඳවයි. එහි අතරක් මෙහි දී පෙන්වා නොමැත. මෙම කාරණාව බාහිය දාරුචිරියගේ මරණය සම්බන්ධයෙන් වන අටුවා විවරණය තුළින් ද අණාවරණය වේ. එහිදී බුද්ධඝෝෂ හිමියන් පවසනුයේ චුතියත් සමඟම ප්‍රතිසන්ධිය වන බවයි.[22] විසුද්ධිමාර්ගයේ ද එම කරුණ ඒ ආකාරයෙන්ම දක්වා ඇත.[23] නමුත් චුතියක් සමඟ ප්‍රතිසන්ධියකට හෙවත් වෙනත් භවයකට පත්වීම එතරම් පිළිගත හැකි කරුණක් නොවේ. මේ පිළිබඳ බොහෝ උගතුන් පවා දක්වන්නේ මෙම අවස්ථා දෙක අතරමැද යම් කාල පරාසයක් තිබිය යුතු බවයි. මෙය සරල නිදසුනකින් විමසා බැලීමේ දී මෙසේ දැක්විය හැක. අන්තරාභවයක් නැතැයි යන මතයට අනුව පුද්ගලයෙකු චුතියක් සමගම ප්‍රතිසන්ධිය ලබන්නේ නම්, චුතිය වන අවස්ථාවේම ප්‍රතිසන්ධියක් සඳහා අවශ්‍ය අනෙකුත් සාධක ද සම්පූර්ණ වී තිබිය යුතුය. නමුත් එය විරල වූ කරුණකි. ස්වාභාවික උවදුරු මෙන්ම හදිසි අවස්ථාවන්හි දී මියයන්නා වූ බොහෝ පිරිස් පිළිබඳ විමසා බැලූ කල උක්ත කාරණාව යථාර්ථයක් සේ පිළිගත නොහැක. එසේ නම් අතීත භවයත්, මතු භවයත්, අතරතුර යම් කාලයක් පවති යන කරුණ යම්තාක් දුරට හෝ පිළිගත හැක. එය පසුකාලීන බෞද්ධ ආචාර්යවරු"ගන්ධබ්බ" අවස්ථාව ලෙස දක්වා ඇත. ථෙරවාදී ඇතැම් ආචාර්යවරු මෙන්ම වෙනත් බෞද්ධ සම්ප්‍රදායයන් විසින් ද එය භාවිත කොට ඇති අයුරු අභිධර්ම කෝෂය අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වේ.[24] මේ පිළිබඳ යම් අදහසක් ආදි බුදුසමයෙන් ද සොයා ගත හැක. සං. නි. කොතුහලසාලා සූත්‍රයේදී වච්ඡගොත්ත හා බුදුරජාණන් වහන්සේ අතර මෙබඳු සාකච්ඡාවක් වේ. වච්ඡගොත්ත බුදුරජාණන් වහන්සේගෙන් විමසනුයේ ගින්න වායුවෙන් දුරට ගෙනයාද, එහි උපාදානය කුමක්ද? යනුවෙනි. මෙයට බුදුරජාණන් වහන්සේගේ පිළිතුර වූයේ ගින්න, වාතය උපාදානය කොට දුරට යන බවයි. නැවත වරක් වච්ඡගොක්ත බුදුරජාණන් වහන්සේගෙන් විමසනුයේ ස්වාමීනි, යම් කලෙක සත්ත්වයා මෙම කය අතහරී

ද, සත්ත්වයා වෙනත් කයට පිවිසියේ නැති ද එම චුති සිතේ උපාදානය කුමක්ද? යනුවෙනි. එයට පිළිතුර ලබාදෙන්නා වූ බුදුරජාණන් වහන්සේ ඉතා පැහැදිලිව එහි උපාදානය තෘෂ්ණාව බව පවසා ඇත.[25]

මෙම ප්‍රකාශය අන්තරාභවය පිළිබඳ අදහසට ඉතා වැදගත් ඉඟියක් සපයන බව පෙන්වා දිය හැක. එසේම ම.නි. සම්මාදිට්ඨි සූත්‍රයෙහි "භූත, සම්භවේසී" යනුවෙන් අවස්ථා දෙකක් පිළිබඳ දැක්වේ. එසේම එම අවස්ථාවන්හි පැවැත්ම සඳහා චතුර්විධ ආහාරයන්හි උපයෝගීතාව ද පෙන්වා දෙයි.[26] එහි අටුවාව මේ පිළිබඳව කරුණු දක්වමින් "භූතාති සඤ්ජාතා" යනුවෙන් හටගත් අය භූත ලෙසත් "සම්භවේසීති යෙ සම්භවං ජාතිං නිබ්බත්තිං එසන්ති ගවෙසන්ති" යනුවෙන් සම්භවයක් ගවේෂණය කරන බැවින් සම්භවේසි යනුවෙන් දක්වා ඇත. මෙහිලා "භූත" යනු නැවත නූපදින අර්ථයෙන් ක්ෂීණාශ්‍රවයන්ට යොදා ඇති නාමයකි.[27] සම්භවේසි යනු ප්‍රහීන නොකළ සංයෝජන ඇති බැවින් මතු භවයක් අපේක්ෂා කරන ශෛක්ෂ හා පුථුජ්ජනයන් විෂයෙහි එන ව්‍යවහාරයකි. මෙයද අන්තරාභව අවස්ථාව පෙන්වා දෙන තවත් එක් අවස්ථාවකි. මෙම අදහසම මෙත්ත සූත්‍රය තුළ භූතා වා සම්භවෙසීවා යනුවෙන් දක්වා ඇත. මීට අමතරව ම.නි. මහාතණ්හාසංඛය සූත්‍රයේ දී සත්වයෙකු මවුකුස පිළිසිඳ ගැනීම සඳහා අවශ්‍ය මූලික කරුණු අතර එක් කරුණක් ලෙස පැහැදිලිවම "ගන්ධබ්බයෙකුගේ පැමිණීම" දක්වා ඇත.[28] එසේම මෙම ගන්ධබ්බ යන්නට ථේරවාද අටුවා සම්ප්‍රදාය තුළ අර්ථ සපයා ඇත්තේ "ගන්ධබ්බොති ගන්තබ්බො" යනුවෙනි. එහි අදහස වනුයේ "එහි එළඹෙන තැනැත්තා" යන්නයි.[29] එසේම "ගන්ධබ්බොති අන්තරාභවිකො පුග්ගලො" යනුවෙන් අර්ථකථනයක් ද දක්නට ඇත. එහි අදහසට ද අනුව අතීත හා වර්තමාන භවයන්ට අතරමැදි අවස්ථාවක් දක්වා ඇත.[30] මෙම අවස්ථාව පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම සඳහා එම තත්වයෙහි ස්වභාවය පිළිබඳ විමසා බැලීම ද වටී. මේ පිළිබඳ කථාවත්ථු අටුවාව සඳහන් කරනුයේ අන්තරාභවික සත්ත්වයා දිවැස් නැතිමුත් දිවැස් ඇත්තෙකු ලෙස ද, ඍද්ධි නැතිමුත් ඍද්ධි



ඇත්තෙකු ලෙස ද කටයුතු කරන බවයි. එසේම ඔහු මව්පිය සමාගමයක් බලමින් මවගේ ඍතු සමයක් සැදෙන තුරු කල් ගෙවයි. එසේ සත් දිනක් හෝ ඊට වැඩිකාලයක් ජීවත් වේ.[31] එසේම කථාවත්ථුවට අනුව අන්තරාභවිකයාට රූපාදි ඉන්ද්‍රියයන් විද්‍යාමාන නොවේ. නමුත් එසේ දක්වනුයේ රූපාදි ඉන්ද්‍රියයන් නොමැති නිසාම නොව, අන්තරාභවිකයාට රූපාදි ඉන්ද්‍රියයන් ඇතත් ඒවා සෙසු සත්ත්වයන්ගේ මෙන් ඕලාරික නොවන නිසාවෙනි. යෝගාචාරභූමි ශාස්ත්‍රයට අනුව පව්කම් කලවුන්ගේ අන්තරාභවය කළුපාට වස්ත්‍රයක වර්ණය මෙන්ද, දැඩි අඳුර ඇති රාත්‍රියක ස්වභාවය මෙන් ද වෙයි. එසේම පින්කම් කළවුන්ගේ අන්තරාභව සුදු වස්ත්‍රයක හෝ සඳපහන් රාත්‍රියක ස්වභාවය ඇත්තේ වේ.[32] මෙම තත්ත්වය තවත් අන්තරාභව සත්ත්වයෙකුට මෙන්ම දිවැස් ඇති පුද්ගලයෙකුට පමණක් දර්ශනය වේ. යෝගාචාරභූමිශාස්ත්‍රයට අනුව අන්තරාභව සත්ත්වයෙකුගේ ආයු කාලය සතියකට පමණක් සීමා වුවද, ථේරවාදී විග්‍රහයන්ට අනුව ඔහුගේ කාලසීමාව මෙපණකැයි නිශ්චිතව දැක්විය නොහැක.

මෙම කාරණාවන්ට අනුව පුද්ගල අතීතභවයේ කර්මශක්තීන් තැන්පත් අවස්ථාව ලෙස ද, මතුභවයක් සඳහා දායකත්වය ලබා දෙන්නා වූ අවස්ථාව ලෙස ද මෙම ගන්ධබ්බ සත්ත්වයා හෙවත් අන්තරාභවිකයා සැළකිය හැකිය. එසේනම් එය චුති විඤ්ඤාණය ලෙස ද සැළකිය හැකිය. එසේ වනුයේ බුදුරජාණන් වහන්සේ මහාතණ්හා සංඛය සූත්‍රය තුළ දැක් වූ "ගන්ධබ්බොච පච්චුපට්ඨිතො හොති" යන සඳහනට සමානව විඤ්ඤාණය යන පදය ද යොදා ඇති බැවිනි. "ඉදින් ආනන්ද විඤ්ඤාණය මව්කුසට ඇතුලු නොවන්නේනම් මව්කුස තුළනාම රූප පහළ වීමක් සිදුවන්නේ ද, "නැත ස්වාමීනි" ඉදින් විඤ්ඤාණය මව්කුස තුළට ඇතුළු වී බැහැර වන්නේ දනාම රූප වර්ධනයක් සිදු වේද?"නැත ස්වාමීනි"[33] මේ තුළින් පැහැදිලි වන්නේ ගන්ධබ්බ අවස්ථාව හා චුති විඤ්ඤාණය අතර යම් සමාන බවක් ඇති බවයි. මෙහි දී මතුවන්නා වූ ගැටලුව නම් විඤ්ඤාණය යන ධර්මතාවයට තනි පැවැත්මක් අර්ථවත් කළ හැකි ද යන්නයි. මහා නිදාන සූත්‍රයට අනුව විඤ්ඤාණයත් නාම රූපයත්

ඔවුනොවුන්ට ප්‍රත්‍යව පවත්නා බව දක්වා ඇත.[34] සූවිසි ප්‍රත්‍ය විභාගයේදී "අඤ්ඤමඤ්ඤපච්චය" නමින් දක්වා ඇත්තේ ද මෙම සම්බන්ධතාවයි. බුදුදහමේ මූලික හරය වන ප්‍රතීත්‍ය සමුප්පාද න්‍යායට අනුව ද විඤ්ඤාණයේ තනි පැවැත්මක් අර්ථවත් කළ නොහැක. එසේනම් මෙම අන්තරාභවික අවස්ථාව යනු කුමක්ද? මේ සඳහා නිගමනය කළ හැක්කේ අන්තරාභවික අවස්ථාව යනු විඤ්ඤාණය පදනම් වූ මනෝමය රූපී අවස්ථාවක් ලෙසය. එය සියලු අතීත කර්ම ශක්තීන් තැන්පත් කරගනු ලබන අතර, මතුභවය හා සම්බන්ධ වීම ද සිද්ධ වේ.

දී.නි. පොට්ඨපාද සූත්‍රය පිළිබඳ විමසා බැලීමේ දී එහි ආත්ම ප්‍රතිලාභ 03 ක් පිළිබඳ දක්වා ඇත. එනම්,

- ඕලාරික අත්තපටිලාභ
- මනෝමය අත්තපටිලාභ
- අරූපී අත්තපටිලාභ[35]

මෙයින් පළමු අත්තපටිලාභය රූපවත් වූ සතර මහා භූතයන් නිසා සැදුණු, කැබලි සහිත ආහාර අනුභව කරණ ඕලාරික වූ ආත්ම ප්‍රතලාභයයි. දෙවැන්න රූපවත් වූ, මනෝමය වූ, සියලු අංග ප්‍රත්‍යයංගයන් ඇති, හීන නොවූ ඉඳුරන්, ඇති මනෝමය වූ ආත්ම ප්‍රතිලාභයයි. තෙවැන්න රූපයක් නැති, සංඥාමය වූ, අරූප ආත්ම ප්‍රතිලාභයයි. මෙම ආත්ම ප්‍රතිලාභයන් අතර "ගන්ධබ්බ" අවස්ථාව යනු අරූපී අත්ත ප්‍රතිලාභයක් හෝ මනෝමය අත්ත ප්‍රතිලාභයක් ලෙස සැළකිය හැක.

උක්ත සාධකයන්ට අනුව ආදි බෞද්ධ හා ථෙරවාද ඉගැන්වීම් තුළ පුද්ගල සාංසාරිකත්වය අර්ථවත් කොට ඇති අයුරු දැකගත හැකි අතර, විඤ්ඤාණය මූලිකව නිර්වාණය දක්වා සසර තුළ ගමන් කරන්නා වූ පදාර්ථයක් පිළිබඳ ඉන් කියැවෙන බව නිගමනය කළ හැක. මෙහි දී සසර පුරාවට ගමන් කරන්නා වූ එම පදාර්ථය ප්‍රතීත්‍යසමුප්පාද න්‍යායානුකූලව පවත්නා බැවින් එය ආත්මවාදි චින්තනයෙන් තොර වූ ඉගැන්වීමක් ලෙස දැක්වේ.



## ආන්තික සටහන්

01. කිච්ඡං වතායං ලොකො ආපන්නො ජායති ච ජීයති ච මීයති ච චවති ච උප්පජ්ජති ච අථච පනිමස්ස දුක්ඛස්ස නිස්සරණං නප්පජානාති, ජරා මරණස්ස. කුදාස්සු නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණං පඤ්ඤායිස්සති. ජරාමරණාස්සාති.
    සං.නි. II ගොතම සුත්ත. බු.ජ.මු.10 පිට.
02. චතුන්නං භික්ඛවෙ අරියසච්චානං අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සංධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. සං.න. V කොටිගාම සුත්ත. බු.ජ.මු. 286 පිට.
03. එත්‍ථාහං භගවතා ධම්මං දෙසිතං අජානාමි. යථා තදෙවිතං විඤ්ඤාණං සන්‍ධාවති සංසරති. ආනන්දන්ති
    ම.නි. I මහාතණ්හා සංඛය සුත්ත. බු.ජ.මු. 605 පිට.
04. තස්ස නු ඛො නාම ත්වං මොඝපුරිස මයා එවං ධම්මං දෙසිතං අජානාසි. නනු මයා මොඝ පුරිස අනෙකපරියායෙන පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං අඤ්ඤත්‍ර පච්චයා නත්‍ථි විඤ්ඤාණස්ස සම්භවොති. ම.නි. I මහා තණ්හා සංඛය සුත්ත. බු.ජ.මු. 605 පිට.
05. J.M. Beazley, Assessment of Life in Utero Nursing Times, 8 May, 1990.
06. ද්වාචත්තාලීසමෙ සත්තාහෙ හොන්ති
    සංඛෙපවණ්ණනාටීකා
07. නවන්නං වා දසන්නං වා මාසානං අච්චයෙන විජායති
    ම.නි. මහාතණ්හා සංඛය සුත්ත
08. වික්‍රමසිංහ, මාර්ටින්, භවකර්ම විකාශය, තිසර ප්‍රකාශන, දුටුගැමුණු වීදිය, දෙහිවල, 1993. 44 පිට.
09. යථොච ඛො භික්ඛවෙ මාතා පිතරො සන්නිපතිතා හොන්ති. මාතාච උතුනි හොති, ගන්‍ධබ්බොච පච්චුපට්ටිතො හොති, එවං තිණ්ණං සන්නිපාතා ගබ්බස්සාවක්කන්ති හොති. ම.නි. I මහාතණ්හා සංඛය සූත්ත. 605 පිට. බු.ජ.මු.
10. පඨමං කලලං හොති, කලලා හොති අබ්බුදා අබ්බුදා ජායතෙ පෙසි පෙසි නිබ්බත්තතෙ ඝනො ඝනා පසාඛා ජායන්ති කෙසා ලොමා නඛා පිච.
11. තිලතෙලස්ස යථා බින්දු සප්පිමණ්ඩො අනාවිලො එවං වණ්ණ පටිභාගං කලලන්ති පවුච්චති.
12. තිහි ජාති උණ්ණාංසුහි කතසුත්තග්ගෙ සණ්ඨිත තෙල බින්දු පමාණං
13. ජාතිඋණ්ණා නාම සුඛුමා තස්සා එකංසුනො පසන්න තිලතෙලෙ පක්ඛිපිත්වා උද්ධටස්ස පග්ඝරිත්වා අග්ගෙ ඨිතබින්දු මත්තං

14. සත්තාහං කලලං හොති පරිපක්කං සමූහකං විවට්ටමානං තබ්භාවං අබ්බුදං නාම ජායති.

15. සත්තාහං අබ්බුදං හොති පරිකප්පං සමූහකං විවට්ටමානං තබ්භාවං පේසි නාම ච ජායති.

16. සත්තාහං පේසි භවති පරිකප්පං සමූහකං විවට්ටමානං තබ්භාවං ඝනොති නාම ජායති.

17. යථා කුක්කුටියා අණ්ඩං සමන්තා පරිමණ්ඩලං එවං ඝණස්ස සණ්ඨානං නිබ්බත්තං කම්මපච්චයා.

18. කතමඤ්ච භික්ඛවෙ මරණං යං තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්සුපච්ඡෙදො ඉදං වුච්චති භික්ඛවෙ මරණං.

19. කතමා ච භික්ඛවෙ ජාති යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො අයං වුච්චති භික්ඛවේ ජාති.

20. චන්දවිමල හිමි, <u>රේරුකානේ, පටිච්චසමුප්පාද විවරණය,</u> ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, 1991. 50-51 පිටු.

21. තස්මිං නිරුද්ධාවසානෙ තස්සානත්තරමෙව තථා ගහිතං ආරම්මණං ආරම්භ භවන්තර පටිසන්ධාන වසෙන පටිසන්ධි සංඛාතං මානසං උප්පජ්ජමානමෙව පතිට්ඨාති භවන්තරෙ
<u>උදානපාලි අට්ඨකතා</u> - බාහිය සුත්ත

22. තෙසං අන්තරිකා නත්ථි වීචි තෙසං න විජ්ජති
<u>විසුද්ධිමග්ග,</u> කංඛාවිතරණ විසුද්ධි නිද්දෙස

23. මෘත්‍යුප්පත්ති භවයො - රන්තරා භවතී භයඃ
ගම්‍ය දේශානු පෙතෙත්වාන් - නොපපන්නොන්තරා භවඃ
<u>අභිධර්මකෝෂ</u>

24. <u>සං.නි.</u> අබ්‍යාකතසංයුක්ත, කොතුහලසාලා සුත්ත.

25. <u>ම.නි.</u> මූලපණ්ණාසක, සම්මාදිට්ඨි සුත්ත.

26. යෙ භූතායෙව න පුන භවිස්සන්තීති සංඛං ගච්ඡන්ති. තෙසං ඛීණාසවානාමෙතං අධිවචනං
<u>පපඤ්චසූදනී</u> - සම්මාදිට්ඨිසුත්ත අට්ඨ කතා.

27. අප්පහීත භවසංයොජනත්තා ආයතිම්පි සංයෝජනං ළසන්තානං සෙඛපුථුජ්ජනාන මෙතං අධිවචනං
<u>පපඤ්චසූදනී</u>* සම්මාදිට්ඨිසුත්ත අට්ඨ කතා.

28. ගන්ධබ්බොච පච්චුපට්ඨිතො හොති
<u>ම.නි. I</u> මහාතණ්හා සංඛය සූත්ත. බු.ජ.මු. 605 පිට.



29. <u>පපඤ්චසූදනි</u> ම.නි. අට්ඨකථා. සරත්චන්ද්‍ර. විජිතානන්ද (පරි) 2008. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල.

30. අතිගරු ආනන්ද මෛත්‍රිය හිමි, <u>පැරීසියේ දී පැවැත්වූ විචිත්‍ර ධර්ම දේශනා.</u> චන්දරතන, පරවාහැර, (සංස්) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 79 පිටුව.

31. යථා සත්තො දිබ්බචක්ඛුකො විය ච අදිබ්බ චක්ඛුකො ඉද්ධිමා විය ච අභිද්ධිමා මාතා පිතු සංගමඤ්චෙව උතු සමයඤ්ච ඕලොකයමානො සත්තාහංවා අතිරෙක සත්තාහං වා තිට්ඨති.
සුමංගල, කන්නිමහර, <u>බුයිඩේ මර්ෆි හා අන්තරාභවය</u> 1980. සී.ස. සංඛ මුද්‍රණ ශිල්පියෝ. 66 පිටුව)

32. රූපාදිවසෙන පුට්ඨොපි යස්මා අන්තරාභව සත්තස්ස අනිදස්සනං රූපං වෙදනාදයො පි අඤ්ඤෙසං විය න ඔලාරිකානි තස්ස ලද්ධි තස්මා පටික්ඛිපති.
එම. 63 පිටුව.

33. මහානිදාන සූත්ත

34. මහානිදාන සූත්ත

35. <u>දී.නි. I</u> පොට්ඨපාද සූත්ත. බු.ජ.මු. 1962. 383 - 436 පිටු.